# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
### 2011 අප්‍රේල් / මැයි

### මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රතිබිම්බ කලා - IMAT- E1025

### ව්‍යවහාරික ඡායාරූපකරණය

**<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි** **කාලය : පැය 03 යි**

---

01. ඡායාරූප ශිල්පය කලා මාධ්‍යයක් වශයෙන් හඳුනාගෙන එහි සමාජ භාවිතය විමසා බලන්න.

02. කෙටි සටහන් ලියන්න.

    i. චරිතාංග ආලේඛ්‍යකරණය (Character Portrait)
    ii. හැඳුනුම්පත් ඡායාරූපය (I D Photography)
    iii. ඡායාරූප සංහිතාව (Photo Essay)
    iv. අපරාධ විද්‍යා ඡායාරූපකරණය (Crime Photography)

03. වනජීවී ඡායාරූපකරණය ලොවට හිතකර මිනිසකු බිහිකරලන්නට වැදගත් මෙහෙවරක් ඉටුකරන බව නිදසුන් සහිතව සනාථ කරන්න.

04. ළමා ඡායාරූපකරණය යන්න අරුත් ගන්වා එය මෙරට ප්‍රචලිත වෘත්තීය ව්‍යවහාරයක් බවට පත්වී නැත්තේ මන්දැයි විමර්ශනය කරන්න.

05. රාත්‍රී දර්ශන ඡායාරූපකරණය සැකෙවින් හඳුන්වා, එළිමහන් රාත්‍රී දසුනක් ඡායාරූප ගතකිරීම සඳහා ඔබ සූදානම් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

06. ඩිජිටල් තාක්ෂණයේ ආගමනය හේතුවෙන් වෘත්තිකයන්ට සීමා වී තිබූ ඡායාරූප ශිල්පය ජනතාකරණය වී ඇතැයි යන මතය විමසුමට ලක්කොට එහි වාසි අවාසි පෙන්වා දෙන්න.

07. ප්‍රවෘත්ති ඡායාරූපකරණයේ මූලධර්ම කවරේ දැයි සඳහන් කොට; දැනුම, පළපුරුද්ද, කාර්යක්ෂමබව සේ ම අවස්ථාවෝචිත ඥානය ද ප්‍රවෘත්ති ඡායාරූප ශිල්පියෙකුට වැදගත් වන බව අභිමත නිදර්ශන ඇසුරින් තහවුරු කරන්න.

08. ''වාණිජ ප්‍රචාරක ඡායාරූපකරණය මගින් නූතන වෙළඳ ආර්ථිකයකට ප්‍රබල ජීව ගුණයක් එක්කොට තිබේ.'' යන මතයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

**************************